මගේ අංකය - JSC/SEC/CIR-L/2025

සියලුම මහාධිකරණ විනිසුරුවරුන් , අධිකරණ නිලධාරීන් වෙත,

<u>අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය සහ අධිකරණ අතර සම්බන්ධිකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම</u>

ශීර්ෂගත කරුණ හා සබැඳිව අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය විසින් මා වෙත යොමු කරන ලද අංක MOJ/DEV/01/COMM/03/71 සහ 2025.06.26 දිනැති ලිපිය හා බැඳේ

02. ඒ අනුව ඉහත කාර්යයන් සම්බන්ධව එක් එක් අධිකරණ කළාපයන්හි විනිසුරුවරුන් සමඟ සාකච්ඡා කර ගැටළු හඳුනා ගැනීම, ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව සළකා බැලීම හා දැනුවත් කිරීම අරමුණු කරගත් වැඩසටහනක් පැවැත්වීමට හා සැලසුම් කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාව අවසර ලබා දී ඇත.

03. මෙම වැඩසටහන පැවැත්වීමට අපේක්ෂා කරනු ලබන අධිකරණ කළාපය, දිනය, ස්ථානය ආදිය පිළිබඳ අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඒ ඒ අවස්ථාවේදී දැනුවත් කිරීමට කටයුතු කරන බව අධිකරණ අමාත්‍යාංශය විසින් දන්වා ඇත.

04. ඒ අනුව අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත දැනුම් දුන් පසු ඒ පිළිබඳව ඔබව දැනුම්වත් කිරීමට කටයුතු කරන බව මෙයින් දැනුම් දෙමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2025 ඔක්තෝබර් මස 21 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය

පිටපත් : ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ලේකම්, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, කොළඹ 10